සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனதுஇல / My No: DSD/HO/05/MF/02/01
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2019.02.28

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2019/02.**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/ බැංකු සමිති කළමනාකරුවන් වෙත**

**"අපේකම රැකගනිමු - ඉතුරුමට මග කියමු"**
**සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2019**

**01.** හැඳින්වීම.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් 2019 වර්ෂයේ සිංහල/ හින්දු අළුත් අවුරුද්ද, බැංකු ගණුදෙනුකරුවන් ඇතුළු සමස්ථ ජනතාව සමඟ උත්සවශ්‍රීයෙන් සැමරීමට සූදානම් කර ඇත.

ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු ජාලය විසින් සිංහල/ හින්දු ගණුදෙනු චාරිත්‍රය හා ජන ක්‍රීඩා වලට මුල් තැන දෙමින් **" අපේකම රැකගමු - ඉතුරුමට මග කියමු"** තේමාව යටතේ වැඩසටහන් රැසක් දියත් කිරීමට සැලසුම් කර ඇත.

**02.** ක්‍රියාත්මක වැඩසටහන්

I. සිංහල/ හින්දු අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන
II. සමෘද්ධි ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශය මූලික කරගත් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.
III. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, දැඩි කැපවීම් කළ බැංකු / නිලධාරීන් ඇගයීම.

**03. සිංහල/ හින්දු අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන**

3.1. 2019 වර්ෂයේ සිංහල/ හින්දු අළුත් අවුරුදු ගණුදෙනු කිරීමේ චාරිත්‍රය මෙවරත් ඉතාමත් උත්සවශ්‍රීයෙන් සැමරීමට, දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු සැලසුම් කර ගත යුතුය. එම ගණුදෙනු චාරිත්‍රය සඳහා සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු2019.04.15 දින විවෘත කර, ගණුදෙනු කිරීම සඳහා ඔබගේ ගණුදෙනුකරුවන්ට ආරාධනා කිරීමට කටයුතු කළ යුතුය.

3.2.අළුත් අවුරුද්ද සඳහා2019.04.15 දින ප්‍රජාමූල සමෘද්ධි බැංකුව සමඟ ගණුදෙනු කරන, ගණුදෙනුකරුවන්ට හෙළ සිරිතට අනුව බුලත් කොලයක තබා රු.10.00 ක කාසියක් තුටු පඬුරක් ලෙස ලබාදීමට කටයුතු කළ යුතුය. එම තුටු පඬුර බැංකුවට පැමිණ මුදල් තැන්පත් කරන ගණුදෙනුකරුවන්ට පමණක් පිරිනැමිය යුතුය. එම කාර්යයට පෙර සූදානමක් ඇතිකර ගත යුතු අතර, අදාල වැයකරන සත්‍ය වියදම, වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන ගිණුමට හර කර පොදු ලෙජරයේ සටහන් කළ යුතුය.

1වනඅදියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල./1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1stStep, 4 th floor, SethsiripayaBattaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ(පාලන හා ආයතන) / பணிப்பாளர்(நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |

3.3. 2019.04.15 දින සමෘද්ධි ප්‍රජාමූල බැංකු විවෘත කර ගණුදෙනු කිරීමට අමතරව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් අප්‍රේල් මස 15 වන දින සිට 29 දින දක්වා එම දෙදින ද ඇතුළත්ව මෙම කාලය තුළ සියළුම ග්‍රාම නිලධාරී වසම් සිසාරා ක්‍රියාත්මක කළ යුතුය.

3.4. එහිදී ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ඉලක්ක ලබාදිය හැක. එමගින් බැංකුවේ අපේක්ෂිත ඉලක්කය වෙත ලගාවීමට උපායමාර්ග ක්‍රමවේදයක් වෙනු ඇත.

3.5. සිංහල/ හින්දු අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක් දැනට ක්‍රියාත්මක සියළුම තැන්පතු ගිණුම් (අනිවාර්ය ඉතිරිකිරීම් හැර) සඳහා ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුල රු.මි.1.2 ක තැන්පතු මුදලක් රැස් කිරීමට සැලසුම් කල යුතුය. (ක්ෂේත්‍ර තැන්පතු ඉලක්කය ද ඇතුලත්ව) නමුත් යම් සමෘද්ධි බැංකුවකට අයත් ග්‍රාම නිලධාරී වසම් ගණන 10 ට අඩු වන විටක බැංකුවේ තැන්පතු ඉලක්කය රු.මි.1 ක් වේ.

3.6. මෙම ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුළ, ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පාලක මණ්ඩල සාමාජිකයන් හා ප්‍රජාමූල සංවිධාන වල නිලධාරීන්ගේ සෘජු දායකත්වය ලබාගත යුතුය.

3.7. ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුල අළුත් අවුරුදු ගණුදෙනු සඳහා තැන්පත් මුදල රු.1,000/- ක් හෝ ඊට වැඩිවන විටක තැන්පතු මුදල්, තැන්පත් කරන ලද දිනයේ සිට අවුරුදු 01ක් බැංකුවේ තැන්පතු ලෙස රඳවාගැනීම අත්‍යාවශ්‍ය වන අතර එම තැන්පතු මුදල ඇපයට තබාගෙන ස්වශක්ති ණය මුදල් ලබාදීම නොහැකි බව ද දන්වමි.

**04. ඉතුරුම් තැන්පතු සඳහා තිළිණ තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා තිළිණ ලබාදීම.**

4.1. 2019 වර්ෂයේ අලුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉතුරුම් තැන්පතු (සිසුරක/ කැකුළු ගිණුම් සඳහා හැර) සඳහා පහත තිළිණ ලබා දීම සිදු කළ යුතුය.

| තැන්පතු මුදල් සීමාව (රු) | තිළිණය | ඒකකයකට වැය කළ හැකි උපරිම මිල (රු) |
|---|---|---|
| රු. 1,000 - 2,499 අතර | ගැළපෙන සුදුසු තිළිණයක් | 75 |
| රු. 2,500 – 4,999 අතර | ගැළපෙන සුදුසු තිළිණයක් | 125 |
| රු. 5,000 - 7,499 අතර | ගැළපෙන සුදුසු තිළිණයක් | 250 |
| රු. 7,500 – 9,999 අතර | ගැළපෙන සුදුසු තිළිණයක් | 350 |
| රු.10,000 – 14,999 අතර | ගැළපෙන සුදුසු තිළිණයක් | 400 |
| රු.15,000 – 29,999 අතර | ආරෝපනය කළ හැකි විදුලි පන්දමක් / විදුලි ස්ත්‍රික්කයක්/ උණු වතුර බෝතලය (Vacuum Flask ) | 750 |
| රු.30,000 – 49,999 අතර | විදුලි කේතලයක් (1.2L) (Mirror Finish) | 1,500 |
| රු.50,000 – 79,999 අතර | විසිල් විදුලි කේතලයක්(1.8L) | 2,250 |
| රු.80,000 – 99,999 අතර | මේස විදුලි පංකාවක් (16")/ රයිස් කුකර් (1.8L) | 3,600 |
| රු.100,000 - 199,999 අතර | සිටුවන විදුලි පංකාවක් (16") | 5,000 |
| රු. 200,000 - 299,999 අතර | ගෑස් උදුන (ලිප් 2) | 6,000 |
| රු. 300,000 - 500,000 අතර | මික්ස් ග්‍රයින්ඩර් (Mixed Grinder) | 7,000 |

4.2. ඉහත 4.1 හි වගුවෙහි සඳහන් ඒකකයක උපරිම මිලට සමාන හෝ ඊට අඩු මිලකට ඇති මෝස්තරයක් තෝරා ගැනීම සිදු කළ යුතු අතර, එහිදී ඊට පහළින් ඇති ඒකකයකට වැය කරන මිලට නොඅඩු මෝස්තරයක් තෝරා නොගැනීමට වග බලාගත යුතුය.

4.3. සිසුරක / කැකුළු ළමා ඉතුරුම් ගිණුම් සඳහා ඉහත 4.1 හි සඳහන් මුදල් සීමාව නොඉක්මන පරිදි බැංකු වැඩසටහනෙහි නාමය ප්‍රචලිත වන අයුරින් ළමුන්ගේ වයස, අධ්‍යාපනය හා ක්‍රීඩාව වැනි කාර්යයන් සඳහා උචිත තිළිණ තෝරාගැනීම ඔබ විසින් සිදු කළ යුතුය. තවද 2018 වර්ෂයේ දී මෙම වැඩසටහන යටතේ කැකුළු / සිසුරක ළමා ඉතුරුම් ගිණුම් සඳහා මුදල් තැන්පත් කරන ලද කැටයට රැස් කරන ලද මුදල මෙම වර්ෂයේදී ළමා ගිණුමට තැන්පත් කරන ලද ළමුන්ට හා නව ළමා ගිණුමක් විවෘත කරන ළමා ගිණුම් හිමියන්ට කැටයක් ලබාදීමට කටයුතු කළ යුතුය.

4.4. තිළිණ සඳහා සුදුසු ආයතනය තෝරා ගැනීමේ කාර්යය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි ප්‍රසම්පාදන කමිටුවට පැවරෙන අතර, එහිදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය.

4.5. භාණ්ඩ සඳහා ආයතන/ විකුණුම්කරුවන් තෝරාගැනීමේ දී, තිළිණ ලබාදීමට පෙර අත්තිකාරම් මුදල් නොදීම හා භාණ්ඩ නොමිළේ ප්‍රවාහනය කරදීම ඇතුළත් කොන්දේසි වලට එකඟකර ගත යුතුය.

4.6 අවුරුදු තිළිණ මිලදී ගැනීමේ දී පහත ආයතනවල ප්‍රධාන කාර්යාල මඟින් ද මිල ගණන් කැඳවීමට හැක. ඒ තුළින් ප්‍රාදේශීය කාර්යාල/ නියෝජිත ආයතන වලින් ඉදිරිපත් කරන මිල ගණන් වලට වඩා අඩු මිල ගණන් ඉදිරිපත් වීම තුළින් එහි වාසිය සමෘද්ධි බැංකුවලට ලබා දීමට හැකියාව ලැබේ.

| අයිතමය | මිල ගණන් කැඳවිය යුතු නිෂ්පාදන/ බෙදා හැරීම් ආයතනය | නිෂ්පාදන හා බෙදා හැරීම් ආයතන වල ලිපිනය |
|---|---|---|
| විදුලි උපකරණ/ ගෘහ උපකරණ | I. එල්.ජී.අබාන්ස් සමාගම | නො.498,ගාලු පාර,කොළඹ-03 |
| | II. සිංගර් ශ්‍රී ලංකා සමාගම | සිංගර් මෙගා හෝම් නො.80,නවම් මාවත, කොළඹ- 02 |
| | III. සී/ස දිනපාල සහ සමාගම | නො.14,අනගාරික ධර්මපාල මාවත,මහනුවර. |
| | IV. දම්රෝ ආයතනය | නො.361, නුවර පාර, නිට්ටඹුව. |
| | V. ටෙලිසොනික්ස් ලංකා (පුද්.) සමාගම | නො.18,ඩේසිවිලා ඇවිනියු, කොළඹ-04 |
| | VI. සොෆ්ට් ලොජික් (පුද්.) සමාගම | නො.402,ගාලු පාර කොළඹ - 03 |
| | VII. සිංහගිරි (පුද්.) සමාගම | නො.515, ටී.බී.ජයා මාවත, කොළඹ - 10 |
| අනෙකුත් තිළිණ (ළමා තිළිණ ඇතුළු) | සුදුසු ආයතන මඟින් | _ |

4.7. සමෘද්ධි බැංකු සඳහා අවශ්‍ය තිළිණ ප්‍රමාණය පිළිබඳ දළ ඇණවුමක් බැංකු මඟින් ලබා ගෙන ප්‍රසම්පාදන කාර්යය සිදු කළ යුතුය. තවද තිළිණයේ **"සමෘද්ධි බැංකුව"** යන්න මුද්‍රණය කර හෝ ස්ටිකරයක් ඇලවීම අනිවාර්ය වන අතර, එය මිල ගණන් කැඳවීමේදී සැපයුම්කරුවන් විසින් අනිවාර්යයෙන්ම සිදු කළ යුතු අංගයක් වන බවද දන්වමි.

4.8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය 2019.04.01 දිනට පෙර ප්‍රසම්පාදන කටයුතු සිදු කර අදාළ ආයතන තෝරා ගැනීමටකටයුතු කළ යුතුය. ඉන් අනතුරුව, බැංකුවල ප්‍රදර්ශනය සඳහා තිළිණ ලබා දීමට කටයුතු කළ යුතු වේ. (හැකි ඉක්මනින් ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම භාණ්ඩ කල්වේලා ඇතුව ලබාගැනීමට පහසුවන බව ද සටහන් කරමි)

4.9. සමෘද්ධි බැංකු විසින් ද තිළිණ ලබා දීම කඩිනමින් සිදු කර අවසන් කළ යුතුය.

4.10. සාමාජික නොවන/ සමූහ ඉතිරිකිරීම් ගිණුම් සඳහා තැන්පතු රැස්කිරීමේදී, ඔවුන්ගේ ඉල්ලීම අනුව ඉහත මුදල් සීමාව තුළ සමිති/ සංවිධානය/ කණ්ඩායම ප්‍රයෝජනයට සුදුසු උපකරණ තිළිණ ලෙස ලබා දීමට ඉඩ දෙනු ලැබේ. එහිදී ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව හරහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.

4.11 මෙම වැඩසටහන යටතේ තිළිණ වෙනුවට මුදල් තැන්පත් කිරීමට කරනු ලබන ඉල්ලීම් නොකළ යුතුය. එමෙන්ම තිළිණ ඉල්ලුම් කිරීමේ වැඩිපුර ලැබෙන තිළිණ ඉදිරි ප්‍රවර්ධන/ ඇගයීම් වැඩසටහන් වලට යොදා ගත හැක.

**05.** **බැංකු කලාප මට්ටමින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.**

5.1. දිවයින පුරා පිහිටි සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු තම කලාපය තුළ එක් අවුරුදු උත්සවයක් සංවිධානය කර පැවැත්වීම අනිවාර්ය වේ.

5.2. අළුත් අවුරුදු උත්සවය 2019.04.21 ඉරිදා දින දවස පුරා පැවැත්වීමට කටයුතු කළ යුතුය. ඒ අනුව එකම දිනයක් තුළ අළුත් අවුරුදු උත්සව 1073 ක් පැවැත්වීමට යෝජිතය. එමෙන්ම වෙනත් සංවිධාන/ ආයතන මගින් සංවිධානය කරන වැඩසටහන් හා බද්ධ වී බැංකුව විසින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම නොකළ යුතුය. එනමුත් අත්‍යවශ්‍ය කරුණකදී පමණක් අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත ලිඛිතව දන්වා අනුමැතිය ලබාගැනීමෙන් බද්ධ වී අවුරුදු උත්සවය පැවැත්වීමට ඉඩකඩ ඇත.

5.3. තවද ඡේද අංක 5.1 හි සඳහන් පරිදි, අදාළ දිනයට විශේෂ හේතුවක් මත අවුරුදු උත්සවය පැවැත්වීමට නොහැකි වන විටක, එම සතියට පසු එළඹෙන පළමු සති අන්ත ඉරිදා දිනය තෝරා ගත යුතුය. ඒ සඳහා පූර්ව අනුමැතිය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගෙන් ලබාගත යුතුය. ඒ පිළිබඳව ප්‍රජාමූල බැංකු අංශය දැනුවත් කිරීම අනිවාර්ය වේ. (අවුරුදු උත්සව වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ තොරතුරු එවීමේ දී, අදාල දිනය වෙනස් කිරීම පිලිබඳ අනුමැතිය ලත් බවට සුවිශේෂ සටහනක් දිස්ත්‍රික්සමෘද්ධි අධ්‍යක්ෂ තැබිය යුතුය.)

5.4. ජන ක්‍රීඩා වලට මුල්තැන දෙමින් බැංකු කටයුතු ප්‍රවර්ධනය වන අයුරින් අවුරුදු උත්සවය පැවැත්විය යුතුය.

5.5. සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් සංවිධානය කරන, බක්මහ උළෙල සඳහා අවශ්‍ය වියදම් පිරිමසා ගැනීමට රු.50,000 ක උපරිම මුදලක් වැය කිරීමට අවසර දෙන අතර, එම මුදලින් රු.15,000 ක් ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් බැංකුවට ප්‍රතිපූර්ණය කරන අතර, වැය වන ඉතිරි මුදල හෝ උපරිම මුදල රු. 35,000/- බැංකු අරමුදලින් දරා ගත යුතුය. වියදම් දැරීමේ දී අදාල මුදල සඳහා පහත ගිණුම් සටහන් තැබිය යුතුය. තවද, ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් බැංකුවට ලබා දී ඇති ඉලක්කය සපුරාගත් විටක පමණක් ප්‍රතිපූර්ණ මුදල් ලබා දීම සිදු කරනු ලබයි.

හර - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කරගත යුතු අරමුදල් ගිණුම (ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල)
හර - වැය ගිණුම උත්සව කටයුතු (බැංකුවෙන් දරන ලද මුදල)
බැර - ජංගම ගිණුම/ මුදල් ගිණුම

5.6. සමෘද්ධි බැංකු විසින් තැන්පතු ඉලක්ක සම්පූර්ණ කරගැනීමට අපොහොසත් වූ විටක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ප්‍රතිපූර්ණ කරගත යුතු අරමුදල් ගිණුමෙහි සටහන් කර ඇති මුදල ප්‍රතිසටහන් මගින් බැංකු වියදමක් ලෙස ගිණුම් ගත කළ යුතුය.

5.7 අවුරුදු උත්සවය පවත්වා මැයි මස 08ට පෙර ප්‍රතිපූර්ණය කරගත යුතු මුදල් සම්බන්ධ තොරතුරු, ආකෘති පත්‍ර 04 ට අනුව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිත දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යොමු කල යුතුය. දිස්ත්‍රික් සමෘද්ධි අංශයේ ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු භාර කළමනාකරු විසින්, දිස්ත්‍රික්කයේ සියළු බැංකු වලට අදාල ඉල්ලීම් සහිත වාර්තාව ඇමුණුම් 05 ට අනුව සකස් කර 2019 මැයි 23 දිනට පෙර ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම අනිවාර්ය වේ. ඉන් අනතුරුව කරන ඉල්ලීම් සම්බන්ධව ප්‍රතිපූර්ණ මුදල් ලබාදීම සිදු නොකෙරේ.

5.8. අළුත් අවුරුදු උත්සවය සඳහා බාහිර සංවිධාන/ පාර්ශවල සහාය හා ආධාර ලබාගැනීමට හැකියාව ඇති අතර, ඒ සම්බන්ධ ලිපි ගොනු ක්‍රමවත් ලෙස නඩත්තු කිරීම කළ යුතුය.

**06.** **සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ කාර්ය භාරය**

6.1. ජාතික හා දිස්ත්‍රික් ඉලක්ක කරා වැඩසටහන ඉදිරියට ගෙන යාමට සහාය ලබාදීමට බැංකු සමිති ඉලක්කය සපුරාගැනීමට කටයුතු කළ යුතුය. (ඔබ බැංකු සමිති බල ප්‍රදේශයේ සියළු බැංකුවල ඉලක්ක එකතු කර බැංකු සමිති ඉලක්කය සකස් කර ගත යුතුය.) තවද, බැංකු සඳහා ඉලක්ක සකස් කර ගැනීමට සහාය දී, එම ඉලක්ක සපුරාගැනීමට බැංකුවලට සහාය දිය යුතුය. ඒ අනුව ඉලක්ක සපුරාගත් බැංකු සමිති දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමේ ඇගයීමකට ලක් කිරීමට කටයුතු කරනු ලැබේ.

6.2. බැංකු සමිති බල ප්‍රදේශයට අයත් සියළුම බැංකුවල අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට බැංකු සමිති කළමනාකරුගේ මග පෙන්වීම හා අධීක්ෂණය ලබාදිය යුතුය.

6.3. වැඩසටහන් වල ප්‍රගතිය දී ඇති උපදෙස් පරිදි, දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කළ යුතුය.

6.4. අළුත් අවුරුදු උත්සවය සඳහා විධායක කමිටු සාමාජිකයන්ගේ දායකත්වය ලබාදීම හා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම ප්‍රජා මූල සංවිධාන හරහා සිදු කළ යුතුය.

**07. දිස්ත්‍රික් සමෘද්ධි අංශයේ කාර්ය භාරය**

7.1. තැන්පතු සඳහා තිළිණ ලබා දීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා එම කාර්යය කඩිනමින් නිම කිරීමට අවශ්‍ය මග පෙන්වීම හා අධීක්ෂණය සිදුකළ යුතුය.

7.2. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මෙම චක්‍රලේඛ උපදෙස් අනුව, වැඩසටහන් සාර්ථකව සංවිධානය කර ඉලක්ක සපුරාගැනීමට දැනුවත් කළ යුතුය.

7.3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, එක් එක් බැංකුවට ලබාදී ඇති ඉලක්කය එකතු කර දිස්ත්‍රික්කයේ ඉලක්කය සකස් කරගැනීම.

7.4. අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට යෝජිත දිනය හැර වෙනත් දිනයක් පැවැත්වීමට කරන ඉල්ලීම් වලදී අනුමැතිය ලබාදීමට පෙර ඒ පිළිබඳ සුවිශේෂ තත්වයන් හා පිළිගත හැකි හේතුවක් ඇත්නම් පමණක් අනුමැතිය ලබාදීම හා ඒ පිළිබඳව ක්ෂුද්‍ර මූල්‍ය අංශය දැනුවත් කිරීම.

7.5. දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රජාමූල බැංකු විසින් අවුරුදු උත්සවය පවත්වන ස්ථාන පිළිබඳව තොරතුරු 2019.04.11 දිනට පෙර ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත දැනුම් දීමට කටයුතු කිරීම කළ යුතුය.

7.6. අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු උත්සවය සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අංශයේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ලබාදීම.

7.7. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, ඉලක්ක සපුරාගත් නිලධාරීන්/ බැංකු අතරින්, ඉහලම තැන්පතු එකතු කල නිලධාරීන්/ බැංකු/ බැංකු සමිති ඇගැයීම් කිරීම.

7.8. ප්‍රගති වාර්තා නිසි පරිදි ලබාගෙන ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම.

**08. ප්‍රගති වාර්තා හා ප්‍රතිපූර්ණ මුදල් ඉල්ලුම් කිරීම.**

8.1

| වාර්තාව ලබාදිය යුතු බැංකුව/ අංශය | වාර්තාව යොමු කල යුතු දිනය | වගකීම දරන නිලධාරියා | වාර්තාව යොමු කල යුතු බැංකුව/ අංශය | වාර්තාව එවීමට භාවිතා කල යුතු ආකෘතිය |
|---|---|---|---|---|
| <u>ඉතුරුම් රැස් කිරීම් ප්‍රගතිය</u><br>සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | 2019.05.08 | බැංකු කළමණාකරු | ප්‍රජාමූල බැංකු සමිතිය | ඇමුණුම 01<br>ඇමුණුම 06 |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | 2019.05.15 | බැංකු සමිතිකළමණාකරු | දිස්ත්‍රික් සමෘද්ධි අංශය | ඇමුණුම 02<br>ඇමුණුම 06 |
| දිස්ත්‍රික් සමෘද්ධි අංශය | 2019.05.23 | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | ක්ෂුද්‍ර මූල්‍ය අංශය | ඇමුණුම 03<br>ඇමුණුම 06 |
| <u>අළුත් අවුරුදු වියදම් ප්‍රතිපූර්ණය ඉල්ලීම.</u><br>සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | 2019.05.08 | බැංකු කළමණාකරු | සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | ඇමුණුම 04 |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | 2019.05.15 | බැංකු සමිති කළමණාකරු | දිස්ත්‍රික් සමෘද්ධි අංශය | ඇමුණුම 04 |
| දිස්ත්‍රික් සමෘද්ධි අංශය | 2019.05.23 | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | ක්ෂුද්‍ර මූල්‍ය අංශය | ඇමුණුම 05 |

8.2. අළුත් අවුරුදු උත්සව වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා 2018.05.23 දක්වා කාලය ලබාදී ඇත. ඉන් අනතුරුව ප්‍රජාමූල බැංකු අංශයට ලැබෙන ඉල්ලීම් සඳහා මුදල් ලබාදීම සිදු නොකෙරේ.

**09. නිලධාරීන් ඇගැයීම හා ප්‍රශංසා සහතික ලබාදීම.**

9.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විසින් බැංකු සමිති බල ප්‍රදේශයේ වසම් මට්ටමින් ඉහළම තැන්පතු මුදලක් රැස්කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් අතරින් නිලධාරීන් 10 දෙනා තෝරාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ මහ පෙන්වීම යටතේ ප්‍රශංසා සහතික ලබාදීම. තවද, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඉහල තැන්පතු මුදලක් රැස්කරන බැංකු කළමණාකරු ඇතුළු කාර්යය මණ්ඩල ඇගැයීමකට ලක්කර ප්‍රශංසා සහතික ලබාදිම.

9.2. ප්‍රජාමූල බැංකු සමිතියට ඇගයීම් වැඩසටහන සංවිධානය කිරීමට රු.10,000 ක් නොඉක්මවූ මුදලක් බැංකු සමිති අරමුදලින් වැය කිරීමට අවසර ඇත. වැයවන මුදල වැය ශීර්ෂය - උත්සව කටයුතු වියදම් ශීර්ෂයට හර කළ යුතුය.

9.3. දිස්ත්‍රික් සමෘද්ධි අංශය, ඉලක්ක සපුරා ගෙන සාමාන්‍ය ඉහළම තැන්පතු මුදලක් රැස්කර ඇති සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 03 සඳහා, බැංකු සමිති කළමනාකරු/ බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රශංසා සහතික ලබාදිය යුතුය.(බැංකු සමිතියකට අයත් සියළුම ප්‍රජාමූල බැංකු විසින් රැස්කරන ලද තැන්පතු මුදල් වල එකතුව, බැංකු සංඛ්‍යාවෙන් බෙදා සාමාන්‍ය ගත යුතුය.)

9.4. දිස්ත්‍රික්ක මට්ටමින්, ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, බැංකු වලට ලබා දී ඇති ඉලක්කය හෝ ඉලක්ක ඉක්මවා ඉහලම තැන්පතු මුදලක් රැස්කරන හා ඒ සඳහා ඉහලම කැපවීම් කරන ලද බැංකු/ ක්ෂේත්‍ර නිලධාරීන් ඇගැයීමකට ලක් කල යුතුය. එක් එක් දිස්ත්‍රික්කවල බැංකු සංඛ්‍යාව වෙනස් බැවින්, ඇගයීමකට ලක්කල යුතු ක්ෂේත්‍ර නිලධාරීන් හා බැංකු සංඛ්‍යාව පහත වගුවේ සඳහන් වේ. තවද ඇගැයීම් උළෙල සංවිධානය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයන් ද, පහත පරිදික්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබාදෙනු ලැබේ. දිස්ත්‍රික් ඇගැයීම් කටයුතු 2019.08.30 දිනට පෙර අවසන් කළ යුතුය.

| දිස්ත්‍රික්කයක පිහිටි බැංකු සංඛ්‍යාව | ඇගැයීමකට ලක්කල යුතු | | ලබාදෙන මුදල (රු) |
|---|---|---|---|
| | ක්ෂේත්‍ර නිලධාරීන් ගණන | බැංකු ගණන | |
| 50ට අඩු | 10 | 10 | 50,000 |
| 51 – 100අඩු | 12 | 12 | 80,000 |
| 101 ට වැඩි | 15 | 15 | 100,000 |

9.5 දිස්ත්‍රික්කයේ ඉහල තැන්පතු මුදලක් රැස්කරන ලද බැංකු ඇගැයීමේ දී, බැංකු කාර්ය මණ්ඩලයට මෙන්ම එම බැංකු බල ප්‍රදේශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ද ප්‍රශංසා සහතිකයක් ලබාදීමට කටයුතු කල යුතුය. (ඉලක්ක වලට ළඟා වූ නිලධාරීන් සඳහා)

9.6. 2019 සිංහල/ හින්දු අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධනය යටතේ, ඉතුරුම් රැස් කිරීමට ලබා දී ඇති ඉලක්ක සපුරා ගැනීමට, සමෘද්ධි සහනාධාර මුදල් හෝ වෙනත් දීමනාවලින් යම් කොටසක් ඉතුරුම් ලෙස තැන්පත් කරන ලෙස සහනාධාරලාභීන්ට හෝ ප්‍රතිලාභීන්ට බලපෑමක් සිදු නොකළ යුතු අතර, එසේ බලපෑම් සිදු කර ඇති බවට සනාථ වන ක්ෂේත්‍ර නිලධාරීන් හා බැංකු, ඇගැයීම් කාර්යයෙන් සම්පූර්ණයෙන් ඉවත් කල යුතුය. එමෙන්ම තැන්පතු මුදල වසරක් බැංකුවේ රඳවා තැබීමට කටයුතු නොකරන බැංකු ද (ක්ෂේත්‍ර නිලධාරීන් හැර) ඇගැයීම් වැඩසටහනින් ඉවත් කළ යුතුය.

9.7. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉලක්ක සපුරා ගැනීමට බැංකු ණය වැඩසටහන් යටතේ සාමාජිකයින්ට ණය ලබා දී, එසැනින් තැන්පතු ලෙස නැවත බැංකුව වෙත ලබා ගැනීම ද සිදුකරන බව පසුගිය වර්ෂ වල වාර්තා වේ. එවැනි තත්ත්වයක් ඇති නොවිය යුතු බවද දන්වනු කැමැත්තෙමි.

**10.** 2019.04.21 දින අවුරුදු උත්සව රාජකාරී වල නිරත වන, බැංකු හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා දිනක වැටුපක් බැංකු අරමුදලින් ලබාගැනීමට අනුමැතිය ලබාදෙන්නෙමු. තවද, අළුත් අවුරුදු උත්සවයේ රාජකාරී වල නිරත වන, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලයට ප්‍රජාමූල බැංකු සමිති අරමුදලින් දිනක වැටුපක් ලබාගත හැක.

**11.**අළුත් අවුරුදු ගණුදෙනු සඳහා 2019.04.15 දින බැංකුව වෙත පැමිණෙන ගණුදෙනුකරුවන්ට දේශීය රස කැවිළි වලින් සංග්‍රහ කිරීමට රු.5000/- ක මුදලක් වැය කිරීමට ද අනුමැතිය ලබාදෙමි.

**12 විශේෂ කරුණු**

12.1.ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුල ක්ෂේත්‍ර නිලධාරීන් රැස්කරන තැන්පතු මුදල්, 2019.04.30 දින හෝ ඊට පෙර බැංකුව වෙත භාරදිය යුතුය. ඉන් අනතුරුව බැංකුගත කරන මුදල් ඉලක්ක හා ඇගැයීම් කටයුතු සඳහා සුදුසුකම් නොලබයි.නමුත් එම තැන්පතු සඳහා තිළිණ ලබාදීම සිදුකල යුතුය. (ප්‍රමාද කරන තැන්පතු මුදල් සඳහා අය කරන දඩ මුදල් සම්බන්ධ දැනට ක්‍රියාත්මක උපදෙස් වලංගු කර ගත යුතුය.)

12.2 ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේදී, සියළුම බැංකු ගණුදෙනු කරුවන්ට, පැමිණ ගණුදෙනු කිරීමට ආරාධනා කිරීමට කටයුතු කල යුතුය. කිසිදු අයුරකින් චක්‍රලේඛ උපදෙස් වල සඳහන් ඉලක්ක සපුරා ගැනීමට ගණුදෙනුකරුවන්ට බලපෑම් නොකරන ලෙසත් පෙර වර්ෂවලදී මෙන්ම සුහදශීලිව ඉතුරුම් කිරීමේ වැදගත්කම හා තැන්පතු මුදල් සඳහා ලබාදෙන ආකර්ශනීය තිළිණ පිළිබඳ දැනුවත් කර දෙමින් මෙම වැදගත් මොහොතට සහසම්බන්ධතාවය ඉහලින්ම ලබා ගැනීමට කටයුතු කරන ලෙස මතක් කර සිටිමු.

**නිමල් කොටවෙලගෙදර,**
**අධ්‍යක්ෂ ජනරාල්. (වැ.බ)**

පිටපත්:-

| | |
|---|---|
| 01.ලේකම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම්අමාත්‍යාංශය. | - කා.දැ.පි. |
| 02.සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, | - කා.දැ.පි. |
| 03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. | - කා.දැ.පි. |
| 04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. | - කා.දැ.පි. |
| 05. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, | - කා.දැ.පි. හා අ.ක.ස |
| 06. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, | - කා.දැ.පි. හා අ.ක.ස |
| 07. සියලුම විධායක කමිටු සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය. | - කා.දැ.පි. |
| 08. සියලුම පාලක මණ්ඩල සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව. | - කා.දැ.පි. |

ඇමුණුම 01

**<u>අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස්කරන ලද තැන්පතු ප්‍රගතිය - 2019</u>**

01. අළුත් අවුරුදු ගණුදෙනු තැන්පතු ප්‍රගතිය (ප්‍රවර්ධන කාලය තුළ බැංකු හා ක්ෂේත්‍රය රැස් කළ තැන්පතු මුදල්)

| ගිණුම් වර්ගය | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල රු. |
|---|---|---|
| | | |
| | | |
| | | |
| එකතුව | | |

02. ක්ෂේත්‍ර සමෘද්ධි නිලධාරීන් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස් කරන ලද තැන්පතු ප්‍රගතිය

| වසම | වසම භාර සමෘද්ධි නිලධාරියාගේ නම | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල රු. |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| එකතුව | | | |

**සකස් කලේ:-**

**නම :-**

**අත්සන :-**

**දිනය :-**

**කළමණාකරුගේ සහතිකය**

**නම :-**

**අත්සන :-**

**දිනය :-**

ඇමුණුම **02**

**අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස් කරන ලද තැන්පතු ප්‍රගතිය - 2019**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය :- ....................................................................................................

01. අළුත් අවුරුදු ගණුදෙනු තැන්පතු හා අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන ප්‍රගතිය

| බැංකුව | අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුළ තැන්පතු ප්‍රගතිය | |
|---|---|---|
| | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස් කරන ලද තැන්පතු මුදල රු. |
| | | |
| | | |
| | | |
| එකතුව | | |

02. ක්ෂේත්‍ර සමෘද්ධි නිලධාරීන් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස් කරන ලද තැන්පතු ප්‍රගතිය

| වසම | වසම භාර සමෘද්ධි නිලධාරියාගේ නම | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල රු. |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**සකස් කලේ:-**

**නම :-**

**අත්සන :-**

**දිනය :-**

**කළමණාකරුගේ සහතිකය**

**නම :-**

**අත්සන :-**

**දිනය :-**

**<u>අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස් කරන ලද තැන්පතු ප්‍රගතිය - 2019</u>**

දිස්ත්‍රික්කය :- ..................................................

01. අළුත් අවුරුදු ගණුදෙනු තැන්පතු හා අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන ප්‍රගතිය

| බැංකුව | අළුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුළ තැන්පතු ප්‍රගතිය | |
|---|---|---|
| | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස් කරන ලද තැන්පතු මුදල රු. |
| | | |
| | | |
| | | |
| එකතුව | | |

02. ක්ෂේත්‍ර සමෘද්ධි නිලධාරීන් අවුරුදු තැන්පතු ප්‍රවර්ධන කාලය තුළ රැස්කරන ලද තැන්පතු ප්‍රගතිය (දිස්ත්‍රික්කය තුල ඉහල තැන්පතු රැස්කල නිලධාරීන් 10 දෙනා පමණයි.)

| වසම | වසම භාර සමෘද්ධි නිලධාරියාගේ නම | ගණුදෙනු කරන ලද ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල රු. |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**සකස් කලේ**

**නම :-**

**අත්සන :-**

**දිනය :-**

**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**

**අත්සන :-**

**දිනය :-**

........................................
2019...............................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
.......................................

**<u>අලුත් අවුරුදු උත්සව පැවැත්වීම හා ප්‍රතිපූරණ මුදල් ඉල්ලීම.</u>**

........................................ ප්‍රජාමූල බැංකු සමිතිය

| බැංකුවේ නම | අලුත් අවුරුදු උත්සවය පැවැත්වූ දිනය | රැස්කරන ලද මුළු තැන්පතු මුදල (රු.) | දරණ ලද මුළු වියදම (රු.) | ප්‍රතිපූරණ ඉල්ලීම් කරන මුදල (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**සකස් කළේ,**

නම :- ..................................
තනතුරු:- ..................................
අත්සන :- . ...............................
දිනය :- . ...............................

බැංකු කළමනාකරු / ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු

නම :- ............................................
අත්සන :- ............................................
දිනය :- ............................................

**ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය**

අත්සන :- ................................................
දිනය :- ................................................

ඇමුණුම **05**

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
........................................
2019...............................

අධ්‍යක්ෂ,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු අංශය,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

**<u>අලුත් අවුරුදු උත්සව පැවැත්වීම හා මුදල් ප්‍රතිපූර්ණය ඉල්ලීම - 2019</u>**

| අනු අංකය | සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නම | අලුත් අවුරුදු උත්සවය පැවැත්වූ දිනය | රැස්කරන ලද ඉතුරුම් මුදල (රු.) | අලුත් අවුරුදු උත්සව වියදම | | වෙනත් |
|---|---|---|---|---|---|---|
| | | | | දරණ ලද මුළු වියදම (රු.) | ප්‍රතිපූර්ණ ඉල්ලීම් මුදල (රු.) | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

**සකස් කළේ,**

**නම :- .......................................**
**තනතුරු:- ........................................**
**අත්සන :- . .......................................**
**දිනය :- . ...................................**

**සහතික කලේ, (දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ)**

**නම :- .........................................**
**අත්සන :- .........................................**
**දිනය :- .........................................**

## <u>සිංහල/ හින්දු අළුත් අවුරුදු මුදල් තැන්පතු රැස්කිරීම් ගිණුම් පිළිබඳ විශ්ලේෂණය - 2019</u>

| බැංකුවේ නම | තැන්පතු මුදල් හි ගිණුම් විශ්ලේෂණය | | | | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.999ට අඩු ගිණුම් සංඛ්‍යාව | රු.1,000 හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාව | රු.5,000 හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාව | රු.10,000 හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාව | රු.25,000 හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාව | රු.50,000 හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාව | රු.100,000 හෝ ඊට වැඩි ගිණුම් සංඛ්‍යාව | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

සකස් කලේ

නම :-

අත්සන :-

දිනය :-

සහතික කලේ

නම :-

අත්සන :-

දිනය :-

නිල මුද්‍රාව තබන්න